# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

## ක්ෂුද්‍ර මූල්‍ය

**ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය කරගෙන යනු ලබන සමාගම් සඳහා බලපත්‍ර දීම, ඒවා නියාමනය හා අධීක්ෂණය කිරීමට ද; ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන වශයෙන් සීමිත ඉතිරි කිරීමේ තැන්පතු භාරගන්නා රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම; ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන සහ ක්ෂුද්‍ර ණය රාජ්‍ය නොවන සංවිධාන නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා ප්‍රමිති ස්ථාපිත කිරීමට සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා විසින් 2016 ජනවාරි මස 12 වන දින ඉදිරිපත් කරන ලදි

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 දෙසැම්බර් මස 21 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

**[59 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 26.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 20.00 යි.**

2—PL 009944—475 (2016 /01)

## ක්ෂුද්‍රමූල්‍ය

L.D.O 32/2012

**ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය කරගෙන යනු ලබන සමාගම් සඳහා බලපත්‍රදීම, ඒවා නියාමනය හා අධීක්ෂණය කිරීමට ද; ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන වශයෙන් සීමිත ඉතිරි කිරීමේ තැන්පතු භාරගන්නා රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීම; ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන සහ ක්ෂුද්‍ර ණය රාජ්‍ය නොවන සංවිධාන නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා ප්‍රමිති ස්ථාපිත කිරීමට සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

1. මේ පනත 2016 අංක දරන ක්ෂුද්‍රමූල්‍ය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි විවිධ දිනවල දී මේ පනතේ විවිධ කොටස් ක්‍රියාත්මක විය යුතු ය.

පනත අදාළ වීම.

2. (1) මේ පනතේ විධිවිධාන -

(අ) 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලත් වාණිජ බැංකුවකට හෝ බලපත්‍රලත් විශේෂිත බැංකුවකට;

(ආ) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලත් මුදල් සමාගමකට;

(ඇ) 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිතියකට හෝ පළාත් සභාවක ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිතියකට;

(ඈ) 2013 අංක 1 දරන දිවිනැගුම පනත යටතේ පිහිටුවන ලද දිවි නැගුම ප්‍රජා මූල බැංකුවකට සහ දිවි නැගුම ප්‍රජා මූල බැංකු සමිතියකට;

(ඉ) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත යටතේ ඇති කරන ලද අස්ථිත්වයකට.

අදාළ නොවිය යුතු ය.

2– PL 009644—475 (2016/01)

(2) VIII වන කොටස, IX වන කොටස සහ XI වන කොටස හැර මේ පනතේ විධිවිධාන, ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන සහ ක්ෂුද්‍ර ණය රාජ්‍ය නොවන සංවිධානවලට අදාළ නොවිය යුතු ය.

## I වන කොටස

### ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය කරගෙන යනු ලබන සමාගම් සඳහා බලපත්‍ර දීම

*ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාගැනීමේ අවශ්‍යතාවය.*

**3.** මේ පනතේ 2 වන වගන්තියේ සලසා ඇති ආකාරයට හැර මිස, ඇපයෙන් සීමිත සමාගමක්, පෞද්ගලික සමාගමක්, අක්වෙරළ සමාගමක් හෝ විදේශීය සමාගමක් නොවන යම් තැනැත්තකු, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් වන්නේ නම් මේ පනත යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලැබිය යුතු ය.

*බලපත්‍රයක් නිකුත් කිරීමේ කාර්ය පටිපාටිය.*

**4.** (1) බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලීමක්ම තත්කාර්ය සඳහා සාදනු ලැබ ඇති රීති මගින් මණ්ඩලය විසින් කලින් කල නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි තොරතුරු සහ ඇගයීම් ගාස්තු සමග එසේ නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් සහ එවැනි අවශ්‍යතා සම්පූර්ණ කරමින් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින්, (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබුණු විට මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලබන තවදුරටත් වූ තොරතුරු සහ ලේඛන ඉල්ලා සිටිය හැකි අතර මණ්ඩලය සෑහීමට පත්වන්නේ නම් -

(අ) තත්කාර්ය සඳහා කරනු ලබන රීතිවලින් දක්වා ඇති සියලුම නියමවලට අනුකූලව අයදුම්කරු විසින් ක්‍රියාකර ඇති විට; සහ

(ආ) ඉල්ලුම්කරුට බලපත්‍රයක් ලබාදීම එහි ණයහිමියන්ගේ හා වෙනත් උනන්දුවක් දක්වන්නන්ගේ යහපතට හානිකර නොවන බවට මණ්ඩලය තීරණය කරන්නේ නම්,

යෝග්‍යයයි සලකනු ලබන නියම හා කොන්දේසිවලට යටත්ව බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකිය; නැතහොත් මණ්ඩලය සෑහීමට පත් නොවන්නේ නම්, ඉල්ලීම ප්‍රතික්ෂේප කර අවශ්‍යයයි සලකනු ලබන විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

බලපත්‍රයක ආකෘතිය සහ කාලසීමාව.

**5.** මණ්ඩලය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් තත්කාර්ය සඳහා මණ්ඩලය විසින් සාදනු ලබන රීතිවලින් නිශ්චිතව දක්වා ඇති ආකෘතියකට අනුකූල විය යුතු අතර බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබූ දිනට පසුව එන ඊළඟ දෙසැම්බර් මස තිස් එක් වන දින දක්වා බලාත්මකව පවතින අතර, අලුත් ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීම මගින් වාර්ෂිකව අලුත් කිරීම සිදු කළ යුතු ය.

බලපත්‍ර ගාස්තුව.

**6.** සෑම බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් විසින්ම මණ්ඩලය විසින් තත්කාර්යය සඳහා කලින් කළ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ප්‍රමාණයට වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් ගෙවනු ලැබිය යුතු ය.

බලපත්‍රය ප්‍රදර්ශනය කිරීම.

**7.** සෑම බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් විසින්ම සිය ප්‍රධාන ව්‍යාපාර ස්ථානයේ සිය බලපත්‍රය ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු අතර, ඒ බලපත්‍රයේ පිටපතක් සිය එක් එක් ශාඛාවෙහි ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

මණ්ඩලය විසින් නාම ලේඛනයක් පවත්වාගෙන යා යුතු බව.

**8.** මණ්ඩලය විසින් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වල නාම ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

## II වන කොටස

## බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වල ව්‍යාපාර සීමා කිරීම්

ව්‍යාපාරවල ස්වභාවය සඳහන් කළ යුතු බව.

**9.** (1) බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් විසින් මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති ආකාරයේ ව්‍යාපාර සහ (2) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් නිශ්චිතව තීරණය කරනු ලැබිය හැකි වෙනත් ආකාරයේ ව්‍යාපාර, යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ හෝ පනවනු ලැබිය හැකි හෝ ඒ බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමට නිකුත් කරනු ලැබ ඇති බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති හෝ සීමාකිරීම් හා කොන්දේසිවලට යටත්ව, කරගෙන යනු ලැබිය හැකි ය.

(2) ගැසට් පත්‍රයේ පල කරනු ලබන දැන්වීමක් මගින්, මේ පනතේ උපලේඛනයේ දක්වා නොමැති වෙනත් යම් ආකාරයේ ව්‍යාපාර බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් විසින් කරගෙන යනු ලැබිය හැකි බව මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කළ හැකි ය.

(3) මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා නොමැති හෝ (2) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් නොකරන ලද හෝ යම් ආකාරයක ව්‍යාපාරයක් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් විසින් කරගෙන යාම නොකළ යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළකරනු ලබන සෑම දැන්වීමක්ම හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරනු ලැබූ යම් දැන්වීමක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(5) දැන්වීම පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලබන දිනය පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

## **III** වන කොටස

### බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම් කළමනාකරණය කිරීම

*සාමාන්‍ය මෙහෙයවීම.*

**10.** (1) බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක කටයුතු සම්බන්ධයෙන් වූ සාමාන්‍ය අධීක්ෂණය හා කළමනාකරණය සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන අතර ඒ මණ්ඩලය විසින් සමාගමේ ව්‍යාපාරික කටයුතු සහ කාර්යයන් සද්භාවයෙන් සහ තැන්පත්කරුවන්ගේ, ණයහිමියන්ගේ සහ වෙනත් උනන්දුවක් දක්වන්නන්ගේ සුභසිද්ධිය වෙනුවෙන් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් විසින්, ඒ සමාගමේ සාමාජිකයින්ගේ, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ සහ ප්‍රධාන විධායක නිලධරයාගේ නම් ඇතුළත් නාමලේඛනයක් පවත්වා ගෙන යා යුතු ය.

## **IV** වන කොටස

### බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වලට විධාන නිකුත් කිරීම හා ඒවා පාලනය වන රීති

*මණ්ඩලයේ විධාන.*

**11.** වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වල, යම් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම් කණ්ඩායමක හෝ වර්ගයක හෝ යම් තනි බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය

සමාගමක (මේ වගන්තියේ "සමාගම" යනුවෙන් හඳුන්වන ලබන) ව්‍යාපාරික හා ආයතනික කටයුතුවල යම් අංගයක් පවත්වාගෙන යායුතු ආකාරය සහ විශේෂයෙන්ම පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් ඒ සමාගම් වෙත විධාන නිකුත් කිරීමට මණ්ඩලයට හැකි ය :-

(අ) ඒ සමාගම විසින් තැන්පතු භාර ගනු ලැබිය හැක්කේ යම් නියම සහ කොන්දේසි යටතේ ද ඒ නියම සහ කොන්දේසි, ඒ තැන්පතු මත ගෙවිය යුතු උපරිම පොලී අනුපාතික, තැන්පතු භාර ගනු ලැබිය හැකි උපරිම කාලසීමාවන් සහ එක් ගිණුමක හෝ ඊට වැඩි ගිණුම් ගණනක එක් තැනැත්තකුගේ නමින් සමාගමක තැන්පත් කළ හැකි උපරිම මුදල් ප්‍රමාණය;

(ආ) ඒ සමාගම විසින් යම් ණයක්, ණය පහසුකමක් හෝ යම් වර්ගයකට අයත් මූල්‍ය පහසුකමක් ප්‍රදානය කරන්නේ යම් නියම සහ කොන්දේසිවලට යටත්ව ද ඒ නියම සහ කොන්දේසි, ඒ ණය, ණය පහසුකම් හෝ වෙනත් වර්ගවලට අයත් මූල්‍ය පහසුකම් මත අය කරනු ලැබිය හැකි උපරිම පොලී අනුපාතික සහ ඒ ණය, ණය පහසුකම් හෝ වෙනත් වර්ගයකට අයත් මූල්‍ය පහසුකම් ප්‍රදානය කරනු ලැබිය හැකි උපරිම කාලසීමාව;

(ඇ) කොමිස්, වට්ටම්, ගාස්තු හෝ වෙනත් කවර වූ හෝ ලැබීම් හෝ ගෙවීම් ආකාරයෙන් ඒ සමාගමට ගෙවනු ලැබිය හැකි නැතහොත් ඒ සමාගම විසින් අය කරනු ලැබිය හැකි උපරිම අනුපාතික;

(ඈ) ඒ සමාගම විසින් ආයෝජන කරනු ලැබිය හැක්කේ යම් නියම සහ කොන්දේසිවලට යටත්ව ද, ඒ නියම සහ කොන්දේසි සහ ඒ ආයෝජන සඳහා අවසර දිය හැකි උපරිම කල්පිරීම්;

(ඉ) පවත්වා ගෙන යායුතු මූලික ප්‍රාග්ධන ප්‍රමාණය සහ මුළු ප්‍රාග්ධන ප්‍රමාණය;

(ඊ) සංචිත අරමුදලක් පිහිටුවීම, එම අරමුදල වෙත බදු ගෙවීමෙන් පසු ඉතිරිවන වාර්ෂික ලාභයෙන් සමාගම විසින් ඒ අරමුදල වෙත මාරු කළ යුතු අවම ප්‍රතිශතය හා ඒ අරමුදලේ වෙනත් මෙහෙයුම් අංග;

(උ) ඒ සමාගමේ වත්කම් සහ සමස්ථ තැන්පතු වගකීම්වලට ඒ සමාගමේ ප්‍රාග්ධනය දරනු ලැබිය යුතු අවම අනුපාතය;

(ඌ) ඒ සමාගමේ සමස්ථ තැන්පතු වගකීම්වලට සමාගමක් විසින් දරනු ලැබිය යුතු ඒ සමාගමේ ද්‍රවශීලී වත්කම්වල අවම අනුපාතිකය;

(එ) සමාගමේ සමස්ත නොගෙවා ඇති පහසුකම්වලට දරනු ලැබිය යුතු සම්පූර්ණ නොගෙවා ඇති තැන්පතු වගකීමේ උපරිම අනුපාතිකය;

(ඒ) සමාගම විසින් අඩු ආදායම්ලාභී තැනැත්තන් සහ ක්ෂුද්‍ර ව්‍යවසායකයන් වෙත ප්‍රදානය කර ඇති නොගෙවා ඇති මූල්‍ය පහසුකම් එම සමාගම විසින් ප්‍රදානය කර ඇති සම්පූර්ණ නොගෙවා ඇති  මූල්‍ය පහසුකම්වලට දරනු ලබන අවම අනුපාතිකය;

(ඔ) තැන්පතු රක්ෂණ අරමුදලක් පිහිටුවීම, ඒ සමාගම ඒ අරමුදල වෙත මාරු කළ යුතු වාරිකය හා ඒ අරමුදලේ අනෙකුත් මෙහෙයුම් අංග;

(ඕ) ඒ සමාගම විසින් පිළිගනු ලැබිය යුතු සංස්ථාපිත පාලන සංග්‍රහය, අවදානම් පරිපාලනය සහ අභ්‍යන්තර පාලනය;

(ක) සමාගම විසින් පිළිගනු ලැබිය යුතු චර්යා පද්ධතිය;

(ග) ඒ සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධරයාගේ, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධරයන්ගේ සහ ඒ සමාගමේ නිශ්චිත කොටස් හිමි තැනැත්තන්ගේ සුදුසුකම් හා යෝග්‍යතාව තක්සේරු කිරීම සඳහා නිර්ණායක;

(ච) ඒ සමාගමේ සංස්ථාපිත හෝ ව්‍යාපාර කටයුතුවල ව්‍යුහමය වෙනස් කිරීම් සම්බන්ධයෙන් සීමාකිරීම්;

(ජ) තැනැත්තකු එම සමාගමේ අධ්‍යක්‍ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයා, ලේකම්වරයා හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධරයන් වශයෙන් පත් කිරීමට හෝ තෝරාපත්කර ගැනීමට හෝ ධූර දැරීම සඳහා නුසුදුස්සකුවීමට හේතු;

(ට) ඒ සමාගම්වල අධ්‍යක්‍ෂවරයන් පත් කිරීම, තෝරාපත් කරගැනීම හෝ නම් කිරීම සඳහා අධ්‍යක්‍ෂවරයාගේ පූර්ව අනුමතය ලබා ගැනීමේ අවශ්‍යතාවය; සහ

(ඩ) ඒ සමාගමේ ප්‍රධාන විධායක නිලධරයා සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධරයන් පත් කිරීම සඳහා අධ්‍යක්‍ෂවරයාගේ පූර්ව අනුමතය ලබා ගැනීමේ අවශ්‍යතාවය.

මේ වගන්තියේ කාර්යය සඳහා -

"ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධරයන්" යන්නෙන්, යම් සමාගමක (විධායක හෝ විධායක නොවන) යම් අධ්‍යක්ෂවරයකු ඇතුළු ඍජුව හෝ වක්‍රව යම් මූල්‍ය සමාගමක කටයුතු සැලසුම් කිරීම, ඒ සඳහා විධාන කිරීම හා පාලනය කිරීම සඳහා බලය සහ වගකීම දරනු ලබන යම් තැනැත්තකු අදහස් වේ;

"නිශ්චිතව සඳහන් කිරීම" යන්නෙන් තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කිරීම අදහස් වේ.

විධානවලට අනුකූලවීම අධීක්ෂණය කිරීම.

**12.** (1) 11 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද විධානවලට අනුකූලව ක්‍රියා කරන්නේ ද යන්න අධීක්‍ෂණය කළයුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයා වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) 11 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ යම් විධානයක් අනුව කටයුතු කිරීම බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් විසින් පැහැර හරින අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ නිකුත්කරනු ලැබූ මාර්ගෝපදේශවල අන් ආකාරයකට විධිවිධාන සලසා තිබේ නම් හැර, අධ්‍යක්ෂවරයා විසින් ඒ බව මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබිය යුතු අතර එවැනි අවස්ථාවක දී මේ පනතේ 17 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

මණ්ඩලය විසින් රීති සෑදිය හැකි බව.

**13.** (1) මණ්ඩලය විසින්, කලින් කළ මේ පනත යටතේ රීති සාදනු ලැබීමට බලය පවරා ඇති හෝ නියම කරනු ලැබ ඇති හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි, මණ්ඩලය විසින් විශේෂයෙන්ම, පහත සඳහන් කරුණු සියල්ලම හෝ යම් කරුණක් සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය :-

(අ) මේ පනත යටතේ බලපත්‍ර දියයුතු ආකාරය පිළිබඳ නිර්ණායක;

(ආ) ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් වශයෙන් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීමක් ඇගයීම වෙනුවෙන් තක්සේරු ගාස්තු;

(ඇ) ක්ෂුද්‍රමූල්‍ය සමාගම් විසින් මණ්ඩලය වෙත ගෙවිය යුතු වාර්ෂික බලපත්‍ර ගාස්තුව;

(ඈ) මේ පනත යටතේ භාවිත කළ යුතු ආකෘති පත්‍ර.

(3) මේ පනත යටතේ මණ්ඩලය විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

## V වන කොටස

### බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වල මූල්‍ය ප්‍රකාශ හා ඒවා විගණනය කිරීම

බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වල මුදල් වර්ෂය හා ගිණුම් විගණනය.

**14.** (1) සෑම බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් විසින් එක් එක් මුදල් වර්ෂයක් අවසානයේ දී ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුව පහත සඳහන් කරුණු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලැබිය යුතු ය:—

(අ) එක් එක් මුදල් වර්ෂය අවසානයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක්; සහ

(ආ) ඒ මුදල් වර්ෂය සම්බන්ධයෙන් විස්තීරණ ආදායම් ප්‍රකාශයක්.

(2) බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම විසින් පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශ සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක මුදල් වර්ෂය සෑම වර්ෂයකම ජනවාරි පළමුවන දිනෙන් ආරම්භ විය යුතු ය.

(4) සෑම බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් විසින්ම, එක් එක් මුදල් වර්ෂය අවසානයේ මාස තුනක් ඇතුළත—

(අ) පහත සඳහන් දෑ ඇතුළුව විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ -

(i) මුදල් වර්ෂය අවසානයේ පවතින ආකාරයට සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය;

(ii) ඒ මුදල් වර්ෂය සම්බන්ධයෙන් සමාගමේ විස්තීරණ ආදායම් ප්‍රකාශය;

(ආ) මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකවරයාගේ වාර්තාව;

(ඇ) සමාගමේ කටයුතුවල තත්ත්වය පිළිබඳ අධ්‍යක්ෂවරයන්ගේ වාර්තාව; සහ

(ඈ) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යවනු ලබන විගණකවරයාගේ රහස්‍ය ලිපියක් වේ නම් එහි සහතික කරන ලද පිටපතක්,

අධ්‍යක්ෂවරයා වෙත යැවිය යුතු ය.

(5) සෑම බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් විසින්ම, (4) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් ලේඛන, එළඹෙන මුදල් වර්ෂයේ ලේඛන පිළියෙළ කොට ප්‍රදර්ශනය කරන තෙක්, එහි සෑම ව්‍යාපාර ස්ථානයකම ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

(6) මණ්ඩලය විසින්, මේ කොටසේ සඳහන් කර ඇති මූල්‍ය ප්‍රකාශවල ආකෘති සහ කළ යුතු යම් හෙළිදරව් කිරීමේ අවශ්‍යතා නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි අතර ඒ ආකෘති නිශ්චිතව සඳහන්කර ඇති විට සෑම බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමකම මූල්‍ය ප්‍රකාශ ඒ ආකෘතියට අනුව පිළියෙළ කරනු ලැබිය යුතු ය.

(7) මණ්ඩලය විසින් අන් ආකාරයකට තීරණය කරන්නේ නම් හැර, බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක මූල්‍ය ප්‍රකාශ, ඒ සමාගම වෙනුවෙන් ඒ සමාගමේ ප්‍රධාන විධායක නිලධරයා හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙකු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

## VI වන කොටස

## බලපත්‍රලත් ක්‍ෂුද්‍රමූල්‍ය සමාගම් පරීක්ෂා කිරීම සහ අධීක්ෂණ කිරීම

බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම් පරීක්‍ෂා කිරීම සහ අධීක්‍ෂණය කිරීම.

**15.** (1) අධ්‍යක්ෂවරයා, ඔහු විසින් බලය දෙන ලද මහ බැංකුවේ යම් නිලධරයකු හෝ මණ්ඩලයේ අනුමතය ඇතිව අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද වෙනත් යම් තැනැත්තකු විසින්, බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක ගිණුම්, පොත් හා වාර්තා පරීක්ෂා කරනු ලැබිය හැකි අතර ඒ සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ගයන් එකක් හෝ වැඩි ගණනක් ගනු ලැබිය හැකි ය -

(අ) අවශ්‍යයයි ඔහු විසින් සළකනු ලබන සියලු තොරතුරු සපයන ලෙස යම් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමකට හෝ යම් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක අධ්‍යක්ෂවරයකුට, ලේකම්වරයකුට, කළමනාකරුවකුට, සේවා නියුක්තයකුට, විගණකවරයකුට, අනුයෝජිතයකුට හෝ කොන්ත්‍රාත්කරුවකුට නියම කිරීම සහ ඒ බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමේ මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික් ස්වරූපයෙන් පවත්වා ගෙන යන පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ වෙනත් යම් ලේඛන පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස නියම කිරීම සහ නියම කරන ආකාරයකින් ඒ පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර් සහ ඒ වෙනත් ලේඛනවල සත්‍ය බවට සහතික කරන ලද පිටපත් සපයන ලෙසට නියම කිරීම;

(ආ) යම් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක පරිශ්‍රයට හෝ එහි ගබඩා ප්‍රදේශයට ඇතුළුවීම සහ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, ඒ බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමේ මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික් ස්වරූපයෙන් පවත්වාගෙන යනු ලබන එම සමාගමේ පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ වෙනත් ලේඛන පරීක්ෂා කිරීම සහ ඒ පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ ඒ වෙනත් ලේඛනවල සත්‍ය බවට සහතික කළ හෝ නොකළ ඕනෑම ආකාරයක පිටපත් ලබා ගැනීම;

(ඇ) අධ්‍යක්ෂවරයා විසින් බලය පවරන ලද විගණකවරයකුට විගණනය කිරීම සඳහා යම් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක ගිණුම් ඉදිරිපත් කරන ලෙස, යම් තොරතුරු

ඉදිරිපත් කරන ලෙස සහ මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික් ස්වරූපයෙන් පවත්වාගෙන යනු ලබන යම් පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ වෙනත් ලේඛන සපයන ලෙස, ඒ බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමට හෝ එහි අධ්‍යක්ෂවරයකුට, කළමනාකරුවකුට, සේවානියුක්තයකුට, අනුයෝජිතයකුට, කොන්ත්‍රාත්කරුවකුට හෝ ලේකම්වරයකුට නියම කිරීම;

(ඈ) යම් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක අධ්‍යක්ෂවරයකුගෙන්, කොටස්කරුවකුගෙන්, ලේකම්වරයකුගෙන්, කළමණාකරුවකුගෙන්, සේවානියුක්තයකුගෙන්, අනුයෝජිතයකුගෙන්, විගණකවරයකුගෙන් හෝ කොන්ත්‍රාත්කරුවකුගෙන් හෝ ඒ ක්ෂුද්‍රමූල්‍ය සමාගමේ ව්‍යාපාර හෝ ආයතනික කටයුතු පිළිබඳව පළපුරුද්දෙන් දන්නා හෝ ඒ පිළිබඳ දැනුමක් ඇති හෝ ඒ සම්බන්ධව තොරතුරු සන්තකයේ පවතින වෙනත් යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න ඇසීම සහ ප්‍රකාශ වාර්තා කිරීම හෝ අවශ්‍යවේ නම්, අසන ලද ප්‍රශ්නවලට දිවුරුම් පෙත්සමක් මගින් පිළිතුරු සපයන ලෙස හෝ අවශ්‍යවේනම් (17 වන අධිකාරය වූ) දිවුරුම් හෝ ප්‍රතිඥා ආඥා පනතට අනුකූලව දිවුරුම් හෝ ප්‍රතිඥා දෙන ලෙස හෝ විධාන කිරීම සහ ප්‍රශ්න ඇසීමට සැළැස්වීම මෙන්ම ප්‍රකාශ වාර්තා කිරීම හෝ වාර්තා කිරීමට සැළැස්වීම;

(ඉ) යම් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක ව්‍යාපාර හෝ ආයතනික කටයුතු පිළිබඳව පළපුරුද්දෙන් දන්නා හෝ ඒ පිළිබඳ දැනුමක් ඇති හෝ ඒ තොරතුරු සන්තකයේ පවතින හෝ ඒ කටයුතු පිළිබඳ තොරතුරු දන්නා බවට පෙනෙන්නට තිබෙන යම් තැනැත්තකුගෙන් ලිඛිත දැන්වීමක් මගින් තොරතුරු කැඳවීම සහ අවශ්‍ය නම් ඒ තැනැත්තා සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවීම;

(ඊ) යම් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් සමග සම්බන්ධ යම් පාර්ශවයකට, අවශ්‍ය යයි අධ්‍යක්ෂවරයා සළකන තොරතුරු සැපයීමට සහ මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික ස්වරූපයකින් පවත්වාගෙන යනු ලබන ඒ පාර්ශ්වයේ පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ වෙනත් යම් ලේඛන පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීමට සහ ඒ පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ ඒ වෙනත්

ලේඛනවල සත්‍ය බවට සහතික කළ පිටපත් නියම කරන යම් ආකෘතියකින් සැපයීමට නියම කිරීම;

මේ ඡේදයේ කාර්ය සඳහා "සම්බන්ධ පාර්ශ්වය" යන්නෙන් යම් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක පාලක සමාගමක්, යම් පාලිත හෝ ආශ්‍රිත සමාගමක් හෝ යම් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක පාලක සමාගමක යම් පාලිත හෝ ආශ්‍රිත සමාගමක් හෝ අධ්‍යක්ෂවරයාගේ මතයට අනුව යම් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක සැළකිය යුතු මූල්‍ය සම්බන්ධතාවක් හෝ වැදගත් කළමණාකාරීත්ව සම්බන්ධතාවක් දරන වෙනත් යම් අස්ථිත්වයක් හෝ පුද්ගලයකු අදහස් වේ.

(2) ඒ පරීක්ෂණයේ පිරිවැය ඒ බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමෙන් අයකර ගනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ තමාට පනවන ලද යම් නියම අනුව ක්‍රියාකිරීම සෑම තැනැත්තකුගේම කාර්යය විය යුතු අතර -

(අ) මේ වගන්තිය යටතේ අවශ්‍ය වූ යම් තොරතුරක් සැපයීමට හෝ පොතක්, වාර්තාවක්, ලිපිගොනුවක්, රෙජිස්ටරයක් හෝ වෙනත් ලේඛනයක් පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීම පැහැර හරින්නා වූ;

(ආ) සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවූ විට ඒ සඳහා පුද්ගලිකව පැමිණීම පැහැර හරින්නා වූ;

(ඇ) ව්‍යාජ හෝ අසම්පූර්ණ හෝ සාවද්‍ය තොරතුරු, පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර හෝ වෙනත් ලේඛන, ද්‍රව්‍ය හෝ දෙයක් සපයන්නා වූ; හෝ

(ඈ) අධ්‍යක්ෂවරයාට හෝ අධ්‍යක්ෂවරයා විසින් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බලය දෙන ලද යම් තැනැත්තකුට, ඒ යටතේ යම් කාර්යයක් කිරීමේ දී අවහිර කරන්නා වූ,

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය ප්‍රකාරව මෙහෙයවන ලද පරීක්ෂණ අවසන්වීමෙන් පසු බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම විසින්:—

(අ) එහි තැන්පත්කරුවන්ගේ ණය හිමියන්ගේ සහ වෙනත් උනන්දුවක් දක්වන්නන්ගේ සම්බන්ධතාවලට හානිදායක වන අයහපත් හෝ අයෝග්‍ය මූල්‍ය පරිචයන් අනුගමනය කරමින් සිය ව්‍යාපාර කරගෙන යන බව; හෝ

(ආ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද හෝ පනවන ලද යම් විධානයක්, රීතියක්, නියමයක් හෝ නියම කිරීමක් උල්ලංඝනය කරනු ලැබ ඇති බව හෝ ඊට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබ ඇති බව,

හෙළිදරව් වුවහොත් ඒ පරීක්ෂණය සම්බන්ධයෙන් වාර්තාවක් අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් සම්බන්ධයෙන් මණ්ඩලයේ අධීක්ෂණ පියවර.

**16.** (1) අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවක් මත යම් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් විසින් -

(අ) එහි තැන්පත්කරුවන්ගේ ණය හිමියන්ගේ සහ වෙනත් උනන්දුවක් දක්වන්නන්ගේ සම්බන්ධතාවලට හානිදායක වන අයහපත් හෝ අයෝග්‍ය මූල්‍ය පරිචයන් අනුගමනය කරමින් එහි ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන බව හෝ කරගෙන යාමේ ක්‍රියා මාර්ගයක් අනුගමනය කරන බව; හෝ

(ආ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද හෝ පනවනලද යම් විධානයක්, රීතියක්, නියමයක් හෝ නියම කිරීමක් උල්ලංඝනය කරනු ලැබ ඇති බව හෝ ඊට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරිනු ලැබ ඇති බව,

මණ්ඩලයේ මතය වන විට, මණ්ඩලය විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග එකක් හෝ වැඩි ගණනක් ගනු ලැබිය හැකි ය :—

(i) එවැනි යම් පරිචයන් අනුගමනය කිරීමෙන් වලකින ලෙස ඒ ක්ෂුද්‍රමූල්‍ය සමාගම වෙත විධානය කිරීම;

(ii) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද හෝ පනවන ලද විධානයක්, රීතියක්, නියමයක් හෝ නියම කිරීමක් පිළිපැදීමට යම් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් අසමත්ව ඇති විට, වහාම හෝ මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාල සීමාවක් තුළ ඒවා පිළිපදින ලෙස ඒ ක්ෂුද්‍රමූල්‍ය සමාගමට විධානය කිරීම;

(iii) එම පරිචයෙන් හෝ උල්ලංඝනයෙන් ඇති වූ සෘණ තත්ත්ව නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස එම බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම වෙත විධානය කිරීම;

(iv) බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු, කළමණාකරුවකු හෝ පාලකයකු ඒ ක්ෂුද්‍රමූල්‍ය සමාගමේ හෝ ඊට සම්බන්ධ යම් කර්තව්‍යයක් කිරීමෙන් වළක්වාලීම;

(v) බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමේ යම් අධ්‍යක්ෂවරයකු, කළමණාකරුවකු හෝ සේවානියුක්තයකු යම් නිශ්චිත කාලසීමාවක් තුළ ඉවත් කරන ලෙස ඒ බලපත්‍රලත් ක්ෂුද්‍රමූල සමාගමට විධානය කිරීම;

(vi) බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමේ ප්‍රාග්ධනය වර්ධනය කිරීමට කටයුතු සැළැස්වීමෙන් හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලය නැවත සංයුක්ත කිරීමෙන් හෝ ඒ ක්‍රියාමාර්ග දෙකම ගැනීමෙන් ඒ සමාගම ප්‍රතිසංවිධානය කිරීමට නියම කිරීම;

(vii) අවශ්‍ය විටක, බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම සමග ඒකාබද්ධවීමට කැමැත්ත ප්‍රකාශ කරන වෙනත් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් හෝ වෙනත් යම් ආයතනයක් සමග ඒකාබද්ධ කිරීම සඳහා කටයුතු සැළැස්වීම;

(viii) බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමේ ව්‍යාපාර කටයුතු යෝග්‍ය පරිදි කරගෙන යාම සහතික කිරීමේ අරමුණින් ඒ බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා තැනැත්තකු පත් කිරීම;

(ix) ක්ෂුද්‍රමූල්‍ය සමාගමකට දඩයක් නොපැනවිය යුත්තේ මන්දැයි, දැන්වීමේ සඳහන් දින සිට දින දාහතරක් ඇතුළත, හේතු දක්වන ලෙස නියම කරමින් ඒ සමාගමට දැන්වීමක් භාරදීම සහ එහි සඳහන් කාලසීමාව තුළ එසේ හේතු දැක්වීමට එය අපොහොසත් වන විට හෝ දක්වන ලද හේතු සම්බන්ධයෙන් මණ්ඩලය සෑහීමට පත් නොවන විට මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාලයක් තුළ දී ගෙවිය යුතු වන රුපියල් දෙලක්ෂ පනස් දහසක් නොඉක්මවන දඩයක් පැනවීම.

(2) (1) වන උපවගන්තිය යටතේ ගන්නා ලද පියවර හෝ යම් නිකුත් කරන ලද නියමයක් හෝ විධානයක් හේතුවෙන් පීඩාවට පත්වූ යම් තැනැත්තකු එම නියමය හෝ විධානය නිකුත් කරනු ලැබූ දින හෝ අදාළ පියවර ගනු ලැබූ දින සිට දින තිහක් ඉක්මවීමට ප්‍රථමයෙන් මණ්ඩලය වෙත ලිඛිතව අභියාචනය කළ හැකි අතර එවැනි අභියාචනයක් ලැබී දින හැටක් ඇතුළත මණ්ඩලය විසින් සිය තීරණය ලබා දිය යුතු ය.

## VII වන කොටස

### බලපත්‍රය අවලංගු කිරීම සහ බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් ගණන් බේරා වසා දැමීම

*බලපත්‍ර අවලංගු කිරීමට හේතු.*

**17.** පහත සඳහන් හේතු එකක් හෝ වැඩි ගණනක් මත මණ්ඩලය විසින් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැකිය :-

(අ) බලපත්‍රය නිකුත් කිරීමෙන් මාස නවයක් ඇතුළත ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම පැහැර හැරීම;

(ආ) සමාගම විසින් උපචිත කරගන්නා ලද යම් ණය මුදලක් ආපසු ගෙවීමට ඇතිවිට එය ගෙවීම පැහැර හැරීම;

(ඇ) එහි ණය හිමියන් සමග සංයෝජනයක් හෝ එකඟවීමක් ඇතිකර ගැනීම හෝ සංයෝජනයක් හෝ එකඟවීමක් ඇතිකර ගැනීමට යෝජනා කිරීම හෝ ඈවර කිරීමට කටයුතු කිරීම හෝ හමාර කිරීමට හෝ නැතහොත් වෙනත් ආකාරයේ විසුරුවා හැරීමකට ලක්වීම;

(ඈ) ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාර කරගෙන යාම අවසන් කිරීම;

(ඉ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ නිකුත් කරනු ලබන, පනවනු ලබන හෝ සාදනු ලබන ඕනෑම විධානයක්, නියම කිරීමක්, රීතියක්, නියමයක් හෝ තීරණයක් උල්ලංඝනය වන සේ ක්‍රියා කිරීම;

(ඊ) වාර්ෂික බලපත්‍ර ගාස්තුව ගෙවීම පැහැර හැරීම;

(උ) එහි තැන්පත්කරුවන්ගේ හා වෙනත් ණය හිමියන්ගේ යහපතට හෝ ආර්ථිකයට හානිදායක විය හැකි ආකාරයෙන් ස්වකීය ව්‍යාපාරය කරගෙන යාම; හෝ

(ඌ) මණ්ඩලය වෙත සාවද්‍ය, නොමග යවන සුළු හෝ වැරදි සහිත තොරතුරු සැපයීම හෝ වැදගත් තොරතුරු හෙළි කිරීම වසන් කිරීම හෝ පැහැර හැරීම.

බලපත්‍ර අවලංගු කිරීමේ කාර්ය පටිපාටිය.

**18.** (1) මණ්ඩලය විසින් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක බලපත්‍රය අවලංගු කිරීමට පෙර ඒ බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම වෙත දැන්වීමේ දින සිට දින තිහක් ඇතුළත ස්වකීය බලපත්‍රය අවලංගු නොකළ යුත්තේ මන්දැයි හේතු දැක්වීමට නියම කරමින් ලිඛිත දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

(2) එම බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම විසින් නිශ්චිතව සඳහන්ව ඇති කාලය ඇතුළත හේතු දැක්වීම පැහැර හරිනු ලැබුවොත් මණ්ඩලය විසින් ඒ සමාගමේ බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැකි ය.

(3) ඒ ක්ෂුද්‍රමූල්‍ය සමාගම විසින්, (1) වන උපවගන්තිය යටතේ කරන ලද දැන්වීමට අනුව ක්‍රියාකරමින් එහි නිශ්චිතව සඳහන් කරන ලද කාලය ඇතුළත හේතු දක්වන්නේ නම්, දක්වන ලද හේතු සැළකිල්ලට ගෙන සහ ස්වකීය විරුද්ධතා සම්බන්ධයෙන් ක්ෂුද්‍රමූල්‍ය සමාගමට ඇහුම්කන් දීමෙන් පසු මණ්ඩලය විසින් -

(අ) ඒක් ක්ෂුද්‍රමූල්‍ය සමාගම විසින්, තම බලපත්‍රය අවලංගු නොකළ යුත්තේ මන්දැයි යන්නට ප්‍රමාණවත් හේතු දක්වනු ලැබ ඇතැයි මණ්ඩලය සෑහීමකට පත්වන්නේ නම් ඒ බලපත්‍රය අවලංගු නොකර සිටිය හැකි ය; හෝ

(ආ) ඒ බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම විසින්, තම බලපත්‍රය අවලංගු නොකළ යුත්තේ මන්දැයි යන්නට ප්‍රමාණවත් හේතු දක්වා නැතැයි මණ්ඩලය සෑහීමට පත්වන්නේ නම් බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැකි ය.

(4) බලපත්‍රය අවලංගු කරනු ලබන අවස්ථාවක දී වහාම එම බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම වෙත ඒ අවලංගු කිරීම පිළිබඳව ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු අතර, ඒ දැන්වීම කරන ලද දින සිට අවලංගු කිරීම බලාත්මක විය යුතු ය. මණ්ඩලය විසින් ඒ අවලංගු කිරීම පිළිබඳ දැන්වීම ශ්‍රී ලංකාවේ සංසරණය වන අවම වශයෙන් එක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පතක පල කළ යුතු ය.

(5) ක්ෂුද්‍රමූල්‍ය සමාගමක බලපත්‍රය අවලංගු කළ විට මණ්ඩලය විසින්, එම බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමේ නම 8 වන වගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන නාමලේඛනයෙන් ඉවත් කරනු ලැබිය යුතු අතර ඒ සමාගම ගණන් බේරා වසා දැමීම ඇතුළුව අවශ්‍යයයි හැඟෙන යම් විධාන ඒ ක්ෂුද්‍රමූල්‍ය සමාගම වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද යම් විධානයකට අනුකූලව, මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරන ලද කාලය තුළ දී ක්‍රියාකිරීමට එම බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම පැහැර හරින විට දී, 19 වන වගන්තිය යටතේ එම බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා නඩු පවරන ලෙස මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයා වෙත නියම කරනු ලැබිය හැකි ය.

**19.** අධ්‍යක්ෂවරයා විසින් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මත බලයලත් අධිකරණයක් විසින් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් ගණන් බේරා වසා දමන ලෙස නියෝගය කරනු ලැබිය හැකි අතර, එම ක්ෂුද්‍රමූල්‍ය සමාගම ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන්, අධිකරණයේ අධීක්ෂණයට යටත්ව ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් වන 2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ක්ෂුද්‍රමූල්‍ය සමාගම ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. ගණන් බේරා වසා දැමීම.

## VIII වන කොටස

## ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන

රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි සහතිකයක් ලබාගැනීමට ඉල්ලුම් කිරීම.

**20.** (1) 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ) පනත යටතේ ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධානයක් ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස (මෙහි මින්මතු "ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානය" යනුවෙන් හඳුන්වනු ලබන) ලියාපදිංචි සහතිකයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන්නේ ය.

(2) ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබා ගැනීම සඳහා වූ සෑම ඉල්ලීමක්ම (මේ කොටසේ"රෙජිස්ට්‍රාර්වරයා" යනුවෙන් හඳුන්වනු ලබන) ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා විසින් කලින් කල සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වූ ආකෘතියෙන් සහ එසේ ලියාපදිංචි කිරීම සඳහා පිළිපැදිය යුතු නියමවලට අනුකූලව සහ එසේ දක්වනු ලැබිය හැකි යම් තොරතුරු සමග රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) ඉහත කී ඉල්ලීම ලැබීමේ දී රෙජිස්ට්‍රාර්වරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන විමසීම් කළහැකි මෙන්ම අවශ්‍යයයි සළකනු ලබන වැඩිදුර තොරතුරු සහ ලේඛන ඉල්ලා සිටිය හැකි අතර -

(i) තත්කාර්ය සඳහා සාදන ලද රීති මගින් කලින් කල රෙජිස්ට්‍රාර්වරයා විසින් දක්වනු ලබන ලියාපදිංචි කිරීම සඳහා වූ නිර්නායකවලට අනුකූලව ඉල්ලුම්කරු ක්‍රියා කර ඇති බව; සහ

(ii) ඉල්ලුම්කරු ලියාපදිංචි කිරීම ණය හිමියන්ට සහ අනෙකුත් ඒ සම්බන්ධව උනන්දුවක් දක්වන්නන්ට අහිතකර නොවන බවට,

රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත්වන්නේ නම්, රෙජිස්ට්‍රාර්වරයා විසින් සුදුසු යයි සළකනු ලබන නියම හා කොන්දේසිවලට යටත්ව ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කළ යුතු අතර ඔහු සෑහීමකට පත් නොවන්නේ නම් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කර ඔහු විසින් අවශ්‍යයයි සළකනු ලබන විධාන නිකුත් කළ යුතු ය.

**සහතිකය ප්‍රදර්ශනය කිරීම.**

**21.** සෑම ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් විසින්ම එහි ලියාපදිංචි කිරීමේ සහතිකය සිය ප්‍රධාන ව්‍යාපාර ස්ථානයේ ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු අතර ඒ බලපත්‍රයේ පිටපතක් සිය එක් එක් ශාඛාවෙහි ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

**ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානවල නාම ලේඛනය.**

**22.** රෙජිස්ට්‍රාර්වරයා විසින්, ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානවල නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

**රෙජිස්ට්‍රාර්වරයා විසින් රීති සෑදීම.**

**23.** (1) මේ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා සහ මේ පනතේ IX කොටස ප්‍රකාරව මණ්ඩලය විසින් නිකුත් කරන ලද ප්‍රමිති, ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ බලාත්මක කිරිමේ කාර්යය සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන්ම, (1) වන උපවගන්තියෙන් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගති විරහිතව රෙජිස්ට්‍රාර්වරයා විසින් කලින් කළ පහත දැක්වෙන කාරණ සියල්ල හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය :-

(අ) මේ පනතේ මේ කොටස යටතේ ලියාපදිංචි කිරීම සඳහා වූ නිර්නායක;

(ආ) ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් විසින් රෙජිස්ට්‍රාර්වරයාට ගෙවිය යුතු වාර්ෂික ලියාපදිංචි ගාස්තුව;

(ඇ) ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක වාර්තා කිරීමේ සහ හෙළිදරව් කිරීමේ අවශ්‍යතා;

(ඈ) එම ණය සහ ණය පහසුකම් මත අයකරනු ලැබිය හැකි උපරිම පොළී අනුපාතික ඇතුළුව ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් විසින් ප්‍රදානය කරනු ලැබිය හැකි ණය සහ ණය පහසුකම්වලට අදාළ නියම හා කොන්දේසි;

(ඉ) ඉතිරි කිරීම් යොදවා ගැනීමට අදාළ නියම හා කොන්දේසි මෙන්ම එම ඉතුරුම් මත ගෙවිය යුතු උපරිම පොළී අනුපාතික;

(ඊ) හිඟ ණය මුදල් සඳහා වූ හිඟ තැන්පතුවල උපරිම අනුපාතිකය;

(උ) ණය ගැනුම්කරුවන්ගේ සහ තැන්පතුකරුවන්ගේ සංඛ්‍යාව;

(ඌ) පරිභෝගික ආරක්ෂාව;

(එ) ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු ශුද්ධ වත්කම්;

(ඒ) ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් විසින් අනුගමනය කළ යුතු අභ්‍යන්තර පාලනය කිරීම්, අවදානම් පරිපාලනය සහ ආයතන පාලන සංග්‍රහයක්;

(ඔ) ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් කරගෙන යා හැකි ක්‍රියාකාරකම් වර්ග;

(ඕ) මේ කොටස යටතේ භාවිත කළ යුතු ආකෘති පත්‍ර.

(3) රෙජිස්ට්‍රාර්වරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේ වගකීම.

**24.** (1) සෑම ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් විසින්ම රෙජිස්ට්‍රාර්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන ආකාරයට සහ එම ආකෘතිවලට අනුව අදාළ කාල පරතරයන් ඇතිව සහ කාලසීමාවන් තුළ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් විසින් පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශ සුදුසුකම්ලත් විගණකවරයෙකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයා විසින් ගිණුම් පොත් ආදිය පරීක්ෂා කළ හැකි බව.

**25.** (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් තත්කාර්යය සඳහා ලිඛිතව බලය පවරන ලද වෙනත් යම් නිලධරයෙකු විසින් යම් ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක ගිණුම් පොත් සහ වාර්තා පරීක්ෂා කරනු ලැබිය හැකි අතර එම කාර්යය සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ගයන්ගෙන් එකක් හෝ වැඩි ගණනක් ගනු ලැබිය හැකි ය :-

(අ) අවශ්‍යයයි ඔහු විසින් සළකනු ලබන සියලු තොරතුරු සපයන ලෙස යම් ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයකට හෝ යම් ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක අධ්‍යක්ෂවරයකුට, කළමණාකරුවකුට, සේවා නියුක්තයකුට

හෝ විගණකවරයකුට නියම කිරීම සහ ඒ ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයේ පොත්පත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ වෙනත් ලේඛන පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස නියම කිරීම සහ නියම කරන ආකාරයකින් ඒ පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ වෙනත් ලේඛනවල සත්‍ය බවට සහතික කළ පිටපත් සපයන ලෙසත් ඒ ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයට නියම කිරීම;

(ආ) යම් ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයකට ඇතුළු වී එහි ඇති පොත්පත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ වෙනත් යම් ලේඛන පරීක්ෂා කිරීම සහ එම පොත්පත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ වෙනත් ලේඛනවල කවර හෝ ආකාරයක සහතික කරන ලද හෝ නොකළ පිටපත් අවශ්‍ය ඕනෑම ආකාරයකින් ලබා ගැනීම;

(ඇ) රෙජිස්ට්‍රාර්වරයා විසින් බලය පවරන ලද විගණකවරයකුට විගණනය කිරීම සඳහා, යම් ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක පොත්පත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර සහ වෙනත් ලේඛන ඉදිරිපත් කරන ලෙසත් ඒ ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයේ ගිණුම් ඉදිරිපත් කරන ලෙසත් සහ යම් තොරතුරු ඉදිරිපත් කරන ලෙසත් එම ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයට හෝ එහි අධ්‍යක්ෂවරයෙකුට, කළමනාකරුවකුට, සේවා නියුක්තයකුට හෝ විගණකවරයකුට නියම කිරීම.

(2) ඒ පරීක්‍ෂණයේ පිරිවැය එම ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයෙන් අයකර ගනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තමාට පනවන ලද යම් නියම අනුව කටයුතු කිරීම සෑම තැනැත්තකුගේම කාර්යය විය යුතු අතර-

(අ) මේ වගන්තිය යටතේ අවශ්‍ය වූ යම් තොරතුරක් සැපයීමට හෝ පොතක්, වාර්තාවක්, ලිපිගොනුවක්, රෙජිස්ටරයක් හෝ වෙනත් ලේඛනයක් පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීම පැහැර හරින්නා වූ;

(ආ) ව්‍යාජ හෝ අසම්පූර්ණ හෝ සාවද්‍ය තොරතුරු, පොත්, වාර්තා, ලිපිගොනු, රෙජිස්ටර් හෝ වෙනත් ලේඛන සපයන්නා වූ; හෝ

(ඈ) (1) වන උපවගන්තිය යටතේ යම් කාර්යයක් කිරීමේ දී රෙජිස්ට්‍රාර්වරයාට හෝ (1) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් බලය පවරන ලද යම් තැනැත්තකුට බාධා කරන්නා වූ,

යම් තැනැත්තෙකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයාගේ බලතල.

**26.** (1) යම් ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් -

(අ) එහි තැන්පත්කරුවන්ගේ සහ වෙනත් ණය හිමියන්ගේ සම්බන්ධතාවලට හානිදායක වන අයහපත් හෝ අයෝග්‍ය මූල්‍ය පරිචයන් අනුගමනය කරමින් සිය ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන බව හෝ පවත්වාගෙන යාමේ ක්‍රියාමාර්ග අනුගමනය කරන බව; හෝ

(ආ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද හෝ පනවන ලද යම් විධානයක්, රීතියක්, නියමයක් හෝ නියම කිරීමක් උල්ලංඝනය කර ඇති බව හෝ ඊට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරිනු ලැබ ඇති බව,

රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වන අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ගවලින් එකක් හෝ වැඩි ගණනක් ගනු ලැබිය හැකි ය :-

(i) එවැනි යම් පරිචයන් අනුගමනය කිරීමෙන් වලකින ලෙස ඒ ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන වෙත විධාන කිරීම;

(ii) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද හෝ පනවන ලද රීතියක් හෝ නියම කිරීමක් පිළිපැදීමට යම් ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් අසමත්ව ඇති විට, වහාම හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාල සීමාවක් තුළ ඒවා පිළිපදින ලෙස ඒ ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයට විධානය කිරීම;

(iii) එම පරිචයෙන් හෝ උල්ලංඝනයෙන් ඇති වූ සෘන තත්ත්ව නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා

ලෙස ඒ ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයට විධානය කිරිම;

(iv) ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයේ යම් අධ්‍යක්ෂවරයෙකු, කළමනාකරුවෙකු හෝ පාලකයකු එකී ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයේ හෝ ඊට සම්බන්ධ යම් කර්තව්‍යයක් කිරීමෙන් වළක්වාලීම;

(v) ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයේ යම් අධ්‍යක්ෂවරයෙකු, කළමනාකරුවෙකු හෝ සේවා නියුක්තයෙකු ඉවත් කිරීම;

(vi) ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයේ අධ්‍යක්ෂ මණ්ඩලය නැවත සංයුක්ත කිරීමෙන් ඒ ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානය ප්‍රතිසංවිධානය කිරීම:

එසේ වුව ද, රෙජිස්ට්‍රාර්වරයා විසින්, මේ වගන්තියේ (iv), (v) හෝ (vi) අනුඡේදවල සඳහන් වූ යම් ක්‍රියා මාර්ගයක් ගැනීමට පෙර, අදාළ අනුඡේදවල සඳහන් ආකාරයට ක්‍රියාමාර්ග අවස්ථාවෝචිත පරිදි, ඔහුට හෝ එයට විරුද්ධව නොගත යුත්තේ මන්දැයි දැන්වීමේ සඳහන් දින සිට දින දාහතරක් ඇතුළත, හේතු දක්වන ලෙස නියම කරමින් ඒ අධ්‍යක්ෂවරයාට, කළමණාකරුට, පාලකයකුට, සේවා නියුක්තයකුට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට ලිඛිත දැන්වීමක් රෙජිස්ට්‍රාර්වරයා විසින් භාරදිය යුතු අතර තමා සෑහීමට පත්වන ආකාරයට හේතු දැක්වීමක් කර නොමැති බවට රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත් විය යුතු ය.

ලියාපදිංචිය අවලංගු කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට ඇති බලය.

**27.** (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් පහත දැක්වෙන හේතු එකක් හෝ වැඩි ගණන් මත ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය හැකි ය :-

(අ) ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානය විසින් උපචිත කරගන්නා ලද යම් ණය මුදලක් ආපසු ගෙවීමට නියමිතව ඇති විට එකී ණය මුදල ආපසු ගෙවීම පැහැර හැරීම;

(ආ) ස්වකීය ණය හිමියන් සමග යම් සම්මුතියක් හෝ එකඟවීමක් ඇතිකර ගැනීම හෝ සම්මුතියක් හෝ එකඟවීමක් ඇති කර ගැනීමට යෝජනා කිරීම හෝ ඇවර කිරීම හෝ ගණන් බේරා වසා දැමීම හෝ අන්‍යාකාරයකින් විසුරුවා හැරීම;

(ඇ) සීමිත ඉතිරි කිරීමේ තැන්පතු භාරගැනීම නතර කිරීම;

(ඈ) මේ පනතේ යම් විධිවිධාන හෝ ඒ යටතේ නිකුත් කරනු ලබන, පනවනු ලබන හෝ සාදනු ලබන යම් විධානයක්, නියම කිරීමක්, රීතියක්, නියමයක් හෝ තීරණයක් උල්ලංඝනය වන සේ ක්‍රියා කිරීම;

(ඉ) වාර්ෂික ලියාපදිංචි ගාස්තුව ගෙවීම පැහැර හැරීම;

(ඊ) එහි තැන්පත්කරුවන්ගේ සහ වෙනත් ණයහිමියන්ගේ යහපතට හානිකර ආකාරයට ස්වකීය ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම;

(උ) රෙජිස්ට්‍රාර්වරයාට සාවද්‍ය, නොමඟ යවන සුළු හෝ වැරදි සහගත තොරතුරු සැපයීම හෝ වැදගත් තොරතුරු රෙජිස්ට්‍රාර්වරයාට හෙළිදරව් කිරීම පැහැර හැරීම.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක බලපත්‍රය අවලංගු කිරීමට පෙර ඒ ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානය වෙත, දැන්වීමේ දින සිට දින තිහක් ඇතුළත ස්වකීය බලපත්‍රය අවලංගු නොකළ යුත්තේ මන්දැයි හේතු දැක්වීමට නියම කරමින්, ලිඛිත දැක්වීමක් කරනු ලැබිය යුතු ය.

(3) ඒ ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානය විසින් නිශ්චිතව සඳහන්ව ඇති කාලය ඇතුළත හේතු දැක්වීම පැහැරහරිනු ලැබුවහොත් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයේ බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැකි ය.

(4) ඒ ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානය විසින්, (2) වන උපවගන්තිය යටතේ කරන ලද දැන්වීමට අනුව ක්‍රියාකරමින් එහි නිශ්චිතව සඳහන් කරන ලද කාලය ඇතුළත හේතු දක්වන්නේ නම්, දක්වන ලද හේතු සැලකිල්ලට ගෙන සහ ස්වකීය විරුද්ධතා සම්බන්ධයෙන් ක්ෂුද්‍රමූල රාජ්‍ය නොවන සංවිධානයට ඇහුම්කන්දීමෙන් පසු රෙජිස්ට්‍රාර්වරයා විසින් -

(අ) ඒ ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානය විසින්, තම බලපත්‍රය අවලංගු නොකළ යුත්තේ මන්දැයි යන්නට ප්‍රමාණවත් හේතු දක්වනු ලැබ ඇතැයි රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත්වෙන්නේ නම් ඒ බලපත්‍රය අවලංගු නොකර සිටිය හැකි ය; හෝ

(ආ) ඒ ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානය විසින්, තම බලපත්‍රය අවලංගු නොකළ යුත්තේ මන්දැයි යන්නට ප්‍රමාණවත් හේතු දක්වා නැතැයි රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත්වන්නේ නම් බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැකි ය.

(5) බලපත්‍රය අවලංගු කරනුලබන අවස්ථාවක දී වහාම ඒ ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානය වෙත ඒ අවලංගු කිරීම පිළිබඳව ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු අතර ඒ දැන්වීම කරන ලද දින සිට අවලංගු කිරීම බලාත්මක විය යුතු ය. රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ අවලංගු කිරීම පිළිබඳ දැන්වීම ශ්‍රී ලංකාවේ සංසරණය වන අවම වශයෙන් එක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි දිනපතා පුවත්පතක පළකළ යුතු ය.

(6) ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ විට රෙජිස්ට්‍රාර්වරයා විසින් 22 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන නාම ලේඛනයෙන් එකී ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයේ නම ඉවත් කරනු ලැබිය යුතු අතර රෙජිස්ට්‍රාරවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන විධාන එකී ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානය වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

## IX වන කොටස

## මණ්ඩලය විසින් සකස්කරන ලද ප්‍රතිපත්ති, ප්‍රමිති සහ මාර්ගෝපදේශ

ප්‍රතිපත්ති, ප්‍රමිති සහ මාර්ගෝපදේශ.

**28.** (1) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, විනිවිදභාවයෙන් යුතුව වෘත්තීමය සහ විචක්ෂණ ආකාරයට ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය සහ ණයදීමේ කටයුතු පවත්වාගෙන යන බව සහතිකවීම සඳහාත් පාරිභෝගික ආරක්ෂාව සඳහා ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම, ශක්තිමත් කිරීම, සංවර්ධනය කිරීම සහ එහි ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහාත් මණ්ඩලය විසින් :—

(අ) මේ පනතේ VII කොටස ප්‍රකාරව ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා විසින් නියාමනය කරනු ලබන ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන; සහ

(ආ) ක්ෂුද්‍රණය රාජ්‍ය නොවන සංවිධාන,

සම්බන්ධයෙන් ප්‍රතිපත්ති හෝ ප්‍රමිති සකස් කිරීම හෝ මාර්ගෝපදේශ නිකුත් කිරීම කළ හැකි ය.

(2) ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා විසින්, ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන පාලනය වන උචිත රීති සෑදීම මගින්, (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් සකස් කරන ලද ප්‍රතිපත්ති, ප්‍රමිති හෝ මාර්ගෝපදේශ බලාත්මක කළ යුතු ය.

(3) මේ පනතේ viii වන කොටස ප්‍රකාරව ලියාපදිංචි වී ඇති රාජ්‍ය නොවන සංවිධානයකට හැර වෙනත් රාජ්‍ය නොවන සංවිධානයකට සීමිත ඉතිරි කිරීමේ තැන්පතු භාර ගැනීමට මේ වගන්තියේ සඳහන් කිසිවක් මගින් හැකිවන බවට සළකනු නොලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් රාජ්‍ය නොවන සංවිධානයක මාසික, ත්‍රෛයිමාසික, අර්ධ වාර්ෂික හෝ වාර්ෂික මූල්‍ය දත්ත මණ්ඩලය විසින් ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයාගෙන් කැඳවනු ලැබිය හැකි ය.

## X වන කොටස

### නඩු පවරනු ලැබීමට එරෙහි මුක්තිය

**29.** (1) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද හෝ පනවන ලද යම් විධානයක්, රීතියක්, නියමයක් හෝ නියම කිරීමක් යටතේ සිදු කරන ලද හෝ සිදු කරන ලදැයි අදහස් කරනු ලබන හෝ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් මණ්ඩලයට හෝ එහි යම් සාමාජිකයකුට හෝ අධ්‍යක්ෂවරයාට හෝ මහ බැංකුවේ යම් නිලධරයකුට හෝ සේවකයකුට හෝ මේ පනත යටතේ යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කිරීමට මණ්ඩලය හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද වෙනත් යම් තැනැත්තකුට හෝ එරෙහිව අපරාධ නඩුවක් යම් අධිකරණයක පැවරීම, එසේ

නඩු පවරනු ලැබීමට එරෙහි මුක්තිය.

අපරාධ නඩුවක් පැවරීම සඳහා නීතිපතිවරයාගේ පූර්ව ලිඛිත අවසරය ලබා ඇත්නම් මිස නොකළ යුතු ය.

(2) මණ්ඩලයේ සාමාජිකයකු, අධ්‍යක්ෂවරයා හෝ මහ බැංකුවේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් හෝ මණ්ඩලය විසින් බලය ලබා දෙන ලද වෙනත් යම් තැනැත්තකු මේ පනත යටතේ හෝ ඒ යටතේ කරන ලද හෝ පනවන ලද යම් විධානයක්, රීතියක්, නියමයක් හෝ නියම කිරීමක් යටතේ සිදු කරන ලද හෝ සිදු කරන ලදැයි අදහස් කරනු ලබන හෝ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට ඒ තැනැත්තාට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, එකී ක්‍රියාව සිදු කළේ සද්භාවයෙන් බවට අධිකරණය තීරණය කළහොත් සහ එකී මුදල එකී සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අය කර ගනු නොලැබුවහොත්, මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු ය.

## XI වන කොටස

### සාමාන්‍ය

මුදල් ව්‍යාපාර පනතේ සහ බැංකු පනතේ IXඅ කොටසේ විධිවිධාන අදාළ නොවීම.

**30.** 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ විධිවිධාන සහ 1988 අංක 30 දරන බැංකු පනතේ IXඅ කොටසේ සඳහන් විධිවිධාන යම් බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්, ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් හෝ ක්ෂුද්‍ර ණය රාජ්‍ය නොවන සංවිධානයක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

වෙනත් නීතීන්හි බලපෑම.

**31.** වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක්, නියමයක් හෝ රීතියක් බලාත්මක විය යුතු ය.

ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය කරගෙන යාමට වන සීමාකිරීම්.

**32.** බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්, ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් හෝ 2 වන වගන්තිය යටතේ මේ පනතේ විධිවිධානය අදාළ වීමෙන් නිදහස් කර ඇති යම් ආයතනයක් හැර වෙනත් කිසිම තැනැත්තකු විසින් ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය කරගෙන නොයා යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන.

**33.** 32 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනතේ ඕනෑම කොටසක් ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තකු විසින්ම -

(අ) මේ පනතේ ඕනෑම කොටසක් ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ සිට මාස දහ අටක කාලයක් ඒ ව්‍යාපාරය අඛන්ඩව කරගෙන යනු ලැබිය හැකි ය; සහ

(ආ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකරමින් -

(i) බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් ලෙස සිය ව්‍යාපාරය අඛණ්ඩව කරගෙනයාම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට, මණ්ඩලය විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් තුළ දී, ඉල්ලීමක් කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, මේ පනතේ I වන කොටස ක්‍රියාත්මක වන දිනයේ දී VIII වන කොටස ක්‍රියාත්මක නොවී පැවතුන ද එය නොතකා, ඒ තැනැත්තා විසින් මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කරමින්, බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක් ලෙස සිය ව්‍යාපාරය අඛණ්ඩව කරගෙනයාම සඳහා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි යම් කාල සීමාවක් තුළ දී ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය;

(ii) ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස සිය ව්‍යාපාරය අඛන්ඩව කරගෙන යාම සඳහා ලියාපදිංචි සහතිකයක් ලබාගැනීමට රෙජිස්ට්‍රාර්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් තුළ දී ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(ඇ) ඉහත (ආ) ඡේදය යටතේ දක්වා ඇති කාල සීමාව (අ) ඡේදය යටතේ දක්වා ඇති කාල සීමාව තුළ විය යුතු ය.

**"ක්ෂුද්‍රමූල්‍ය" යන නාමය භාවිත කිරීමේ සීමා.**

**34.** මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව හැර, බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්, ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානයක් හෝ මේ පනතේ 2 වන වගන්තිය ප්‍රකාර අදාළ වීමෙන් බැහැර කරන ලද යම් ආයතනයක් නොවන වෙනත් යම් තැනැත්තකු විසින් "ක්ෂුද්‍රමූල්‍ය" යන වචනය හෝ එහි යම් ප්‍රභේදයක් හෝ එහි අන්වක්ෂරීකරනයක් හෝ වෙනත් භාෂාවක එයට සමාන වචනයක්, තනිව හෝ වෙනත් යම් වචනයක් හා සංයුක්තව හෝ ස්වකීය නාමය සඳහා භාවිතා කිරීම නොකළ යුතු ය.

**වැරදි.**

**35.** (1) මේ පනතේ යම් විධිවිධාන හෝ ඒ යටතේ නිකුත් කරන ලද හෝ පනවන ලද යම් රීතියක්, විධානයක්, නියමයක් හෝ නියම කිරීමක් උල්ලංඝනය කරන හෝ ඒවාට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියනයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු එකකට නොවැඩි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ පුද්ගල මණ්ඩලයක් විසින් යම් වරදක් කර ඇති විට, ඒ පුද්ගල මණ්ඩලය -

(අ) සංස්ථාපිත මණ්ඩලයක් වන අවස්ථාවක ඒ සංස්ථාපිත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු, කළමණාකරුවකු හෝ ලේකම්වරයකු;

(ආ) ව්‍යාපාර ආයතනයක් වන අවස්ථාවක ඒ ආයතනයේ සෑම හවුල්කරුවකු; හෝ

(ඇ) ව්‍යාපාර ආයතනයක් හැර සංස්ථාපිත නොවන මණ්ඩලයක් නම් ඒ මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම තැනැත්තකුම,

ඒ වරදකට වරදකරු විය යුතු යః

එසේ වුව ද, සංස්ථාපිත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු, කළමණාකාරවරයකු හෝ ලේකම්වරයකු හෝ ව්‍යාපාර ආයතනයක හවුල්කරුවකු හෝ සංස්ථාපිත නොවන මණ්ඩලයක සාමාජිකයකු විසින් ස්වකීය දැනුවත්භාවයෙන් තොරව එම වරද සිදුවූ බව ඔප්පු කරනු ලැබුවහොත් හෝ එම වරද සිදුවීම වැළැක්වීම සඳහා තමා

විසින් සියලු නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත්, එම තැනැත්තා එම වරදකට වරදකරුවකු නොවන බවට සලකනු ලැබිය යුතු ය.

නිලධරයන්ගේ කටයුතුවලට මණ්ඩලය වගකිව යුතු බව.

**36.** (1) මණ්ඩලය විසින්, මේ පනත යටතේ ඇති එහි යම් බලතල මහ බැංකුවේ යම් නිලධරයකුට හෝ වෙනත් යම් තැනැත්තකුට තත්කාර්යය සඳහා මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි රීති ඇත්නම් ඒ රීතිවලට යටත්ව මේ පනතේ යම් කාර්ය සඳහා මණ්ඩලය නියෝජනය කිරීම පිණිස මහ බැංකුවේ යම් නිලධරයකුට හෝ වෙනත් යම් තැනැත්තෙකුට මණ්ඩලය විසින් ලිඛිතව බලය දෙනු ලැබිය හැකි නමුත් මණ්ඩලය විසින් මණ්ඩලය නියෝජනය කිරීම පිණිස සිය බලය ලබාදුන් නිලධරයා හෝ තැනැත්තා විසින් සිදුකළ ක්‍රියාවක් හෝ කාරණයක් හෝ නොකර හැරීමක් වෙනුවෙන් මණ්ඩලය වගකීමකට බැඳී සිටින අතර, තවදුරටත් අඛණ්ඩව එසේ වගකීමට බැඳී සිටිය යුතු ය.

(2) මණ්ඩලය විසින් මේ පනත යටතේ එයට පවරා ඇති ඕනෑම බලයක් සහ කර්තව්‍යයක් මහ බැංකුවේ යම් නිලධරයකුට ලිඛිතව පවරා දෙනු ලැබිය හැකි වුව ද ඒ නිලධරයා විසින් ඔහුට පවරන ලද එම බලය ක්‍රියාත්මක කිරීමේ දී කරන ලද හෝ අත්හරින ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් වෙනුවෙන් වන වගකීම මණ්ඩලය වෙත පැවරී තිබිය යුතු අතර, එසේ එම වගකීම අඛණ්ඩව පැවතිය යුතු ය.

අර්ථනිරූපනය.

**37.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි -

"මණ්ඩලය" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ;

"මහ බැංකුව" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"තැන්පතුව" යන්නට, කලින් කළ සංශෝධනය විය හැකි 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතින් එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"අධ්‍යක්ෂ" යන්නෙන්, මහ බැංකුවේ ක්ෂුද්‍රමූල්‍ය සමාගම් පිළිබඳ විෂයය පවරනු ලැබ ඇති දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා අදහස්වන අතර, වැඩ බලන අධ්‍යක්ෂවරයකු ද ඇතුළත්වේ;

"බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය සමාගම" යන්නෙන්, මේ පනත යටතේ බලපත්‍රලත් සමාගමක් අදහස් වේ;

"ද්‍රවශීලී වත්කම්" යන්නෙන් —

(අ) අතැති මුදල්;

(ආ) යම් බැංකුකරුවකුගේ ලියමකින් හෝ අයකිරීමකින් නිදහස්, වාණිජ බැංකුවක ඇති ජංගම ගිණුමක හෝ තැන්පතු ගිණුමක ශේෂ;

(ඇ) යම් අය කිරීමකින් හෝ ලියමකින් නිදහස්, එක් අවුරුද්දක් තුළ කල් පිරෙන, ශ්‍රී ලංකා ආණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර;

(ඈ) යම් අය කිරීමකින් හෝ ලියමකින් නිදහස්, එක් අවුරුද්දක් තුළ කල් පිරෙන ශ්‍රී ලංකා ආණ්ඩුවේ සුරැකුම්පත්;

(ඉ) යම් අය කිරීමකින් හෝ ලියමකින් නිදහස්, එක් අවුරද්දක් තුළ කල් පිරෙන, ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම්පත්; සහ

(ඊ) මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි වෙනත් වත්කම්,

අදහස් වේ;

"ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාර" යන්නෙන් මේ පනතේ උපලේඛනයට අනුව යමින්, තැන්පතු භාරගැනීම හා ප්‍රධාන වශයෙන් අඩු ආදායම්ලාභී තැනැත්තන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායන්ට-

(අ) ඕනෑම ආකාරයක මූල්‍ය පහසුකමක් සැපයීම;

(ආ) වෙනත් මූල්‍ය සේවා සැපයීම; හෝ

(ඇ) ඕනෑම ආකාරයක මූල්‍ය පහසුකමක් සහ වෙනත් මූල්‍ය සේවා සැපයීම,

අදහස්වේ;

"ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධානය" යන්නෙන්, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජසේවා සංවිධාන (ලියාපදිංචි කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ) පනත යටතේ ලියාපදිංචි එමෙන්ම සීමිත ඉතුරුම් තැන්පතු භාරගැනීමට ස්වේච්ඡා සමාජසේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයක් දරන රාජ්‍ය නොවන සංවිධානයක් අදහස් වේ;

"ක්ෂුද්‍රණය රාජ්‍ය නොවන සංවිධානය" යන්නෙන්, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ) පනත යටතේ ලියාපදිංචි තැන්පතු භාර ගැනීමට අවසර නොමැති නමුත් ණය දීමේ කටයුතුවල නිරත වන රාජ්‍ය නොවන සංවිධානයක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නට, ක්ෂුද්‍රමූල්‍ය විෂයය පවරන ලද අමාත්‍යවරයා අදහස් කෙරේ;

"සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන් -

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවනු ලැබූ වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නාවූ ද ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

**38.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

උපලේඛනය

(9 වන වගන්තිය)

බලපත්‍රලත් ක්ෂුද්‍රමූල්‍ය ආයතනයක් විසින් පහත සඳහන් ව්‍යාපාරවල යෙදෙනු ලැබිය හැකි ය :-

(අ) නිවාස කටයුතු ඇතුළු සියළුම වර්ගයේ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා මණ්ඩලය විසින් පනවනු ලබන නියම හා කොන්දේසිවලට යටත්ව මුදල්මය හෝ ද්‍රව්‍යමය ආකාරයේ ඇප ඇතිව හෝ නොමැතිව මූල්‍ය පහසුකම් සැපයීම;

(ආ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථ දක්වා ඇති ආකාරයට බැංකු ව්‍යාපාර කටයුතු හැර කාලීන හා ඉතිරිකිරීමේ තැන්පතු භාර ගැනීම, කාලීන තැන්පතු, ඉතිරිකිරීමේ සහ වෙනත් සමාන වර්ගයේ ගිණුම් විවෘත කිරීම, පවත්වා ගෙන යාම සහ කළමනාකරණය කිරීම;

(ඇ) එය විසින් දෙන ලද ණය මුදල් සහ අත්තිකාරම් සුරක්ෂිත කිරීමේ කාර්යය සඳහා ඕනෑම ආකාරයක චංචල හෝ නිශ්චල දේපල ඔඩපනය කිරීම, උකස් කිරීම, ඇපයට තැබීම හෝ පැවරීම;

(ඈ) කාර්මික හා කෘෂිකාර්මික යෙදවුම්, පශුසම්පත්, යන්ත්‍ර සූත්‍ර සහ කාර්මික අමු ද්‍රව්‍ය මිලදී ගැනීම, විකිණීම, හා සැපයීම සඳහා ණය සැපයීම සහ යම් සංවිධානයක් වෙනුවෙන් එවැනි භාණ්ඩ හෝ පශුසම්පත් විකිණීම සඳහා අනුයෝජිතයෙකු වශයෙන් කටයුතු කිරීම;

(ඉ) එහි මුදල් විචක්ෂණශීලීව ආයෝජනය කිරීම;

(ඊ) ගබඩා කිරීමේ හා ආරක්ෂාකාරීව රඳවා තබා ගැනීමේ පහසුකම් සැපයීම;

(උ) කුඩා ව්‍යාපාර, ස්වයං රැකියා ව්‍යාපෘති සහ ගෘහ කර්මාන්තවල ආයෝජනය කිරීම සම්බන්ධයෙන් ස්වකීය පාරිභෝගිකයන්ට වෘත්තීමය උපදේශනය සැපයීම;

(ඌ) ක්ෂුද්‍රමූල්‍ය කටයුතු සම්බන්ධයෙන් ඇතිවිය හැකි විවිධ අවදානම් ආවරණය වන සේවා හා පහසුකම් පාරිභෝගිකයන්ට සැපයීම;

(එ) පාරිභෝගිකයන් වෙත කළමනාකරණ,අලෙවිකරණ ගනුදෙනු, තාක්ෂණික සහ පරිපාලනමය උපදේශ ලබාදීම සහ ඒ ක්ෂේත්‍රවල සේවා ලබා ගැනීම සඳහා ඔවුන්ට සහායවීම;

(ඒ) පාරිභෝගිකයින් වෙත තාක්ෂණික සහාය සහ පුහුණුව ලබාදීම;

(ඔ) අදාළ අධිකාරියෙන් අවශ්‍ය බලපත්‍රය හෝ අනුමතය ලබාගැනීමෙන් පසුව ඒ අධිකාරියේ රීති සහ නියෝගවලට යටත්ව, කල්බදු මූල්‍යකරණ ව්‍යාපාරය, උකස් ගැනීමේ සහ රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යාම; සහ

(ඕ) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය ආයතනයකට නිරතවීමට අවසර ලබා දෙන වෙනයම් ව්‍යාපාර කටයුතු.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.